සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 6 - 2019

නම/විභාග අංකය :.......................................... බුද්ධ ධර්මය කාලය: පැය 02යි.

සැලකිය යුතුයි :

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙක බැගින් හිමිවේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

**ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) සිදුහත් බෝසතාණෝ මව්කුස පිළිසිඳ ගත්තේ,
1. වෙසක් පෝ දිනක ය.
2. ඇසළ පෝ දිනක ය.
3. පොසොන් පෝ දිනක ය.
4. උඳුවප් පෝ දිනක ය.

(2) සුදොවුන් රජතුමා තම පුත් කුමරු හට පළමුවරට වැන්දේ,
1. නම් තැබීමේ උළෙලදා ය.
2. වප් මඟුල් උළෙලදා ය.
3. අසිත තාපස තුමාට කුමරු පෙන් වූ දා ය.
4. කුමරු ඉපදුනදා ය.

(3) යහපත් වචනය තෝරන්න.
1. සත්‍ය වචන කීම
2. කේලාම් කීම
3. පරුෂ වචන කීම
4. හිස් වචන කීම

(4) බිම්බිසාර රජතුමාට මල් සැපයූයේ
1. උදේනි මාලාකරු ය.
2. අසරණ ගොවියෙකු ය.
3. විශාඛා සිටු දියණිය ය.
4. සුමන මාලා කරුය.

(5) අපේ රටට බුදුදහම රැගෙන මිහිඳු හිමි වැඩම කරන විට මෙරට පාලනය කළ රජතුමා වූයේ,
1. සද්ධාතිස්ස රජතුමා ය.
2. දුටුගැමුණු රජතුමා ය.
3. දේවානම්පියතිස්ස රජතුමා ය.
4. ධර්මාශෝක රජතුමා ය.

**ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වල දැක්වෙන වගන්ති හරි නම් (3) ලකුණ ද වැරදි නම් (7) ලකුණ ද ඉදිරියේ ඇති වරහනෙහි යොදන්න.**

(6) සිල්වත් වීමේ ආනිශංසයකි මරණින් පසු සුගතියෙහි ඉපදීම. (    )

(7) ශික්ෂාකාමී භික්ෂූන් අතර අගතනතුර ලැබුණේ රාහුල තෙරුන්ට ය. (    )

(8) අපේ මුල්ම පන්සල කාලපාසාද පිරිවෙනයි. (    )

(9) සම්මා ආජීව යනු යහපත් වචනයයි. (    )

(10) සුගන්ධං සීතලං කප්පං .... යන ගාථාව සුවඳදුම් පූජා කරන ගාථාවයි. (    )

| **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල (අ) කොටසේ වචන හා සම්බන්ධ වන (ආ) කොටසේ වචනය තෝරා ඉරකින් යා කරන්න.**

| | (අ) | (ආ) |
|---|---|---|
| (11) | දියුණුවේ දොරටුවකි | යහපත් දිවි පැවැත්මයි. |
| (12) | සම්මා ආජීව යනු | සංඝමිත්තා රහත් මෙහෙණියයි. |
| (13) | ලක්දිව පැවිදි වූ මුල්ම කාන්තාව | දැහැමිව ජීවත් වීමයි. |
| (14) | ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවූයේ | වෙනස්වීමයි. |
| (15) | අනිත්‍යතාව යනු | අනුලා දේවිය. |

| **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න.**

**( සිඟාලෝවාද / චුල්ලරාහුලෝවාද / ජාතික ගීය / අත්තසස්ස ද්වාර / නා ගස )**

(16) රාහුල හිමි ........................................................................ සූත්‍රය අසා රහත් වූහ.

(17) දියුණුවේ රහස් පෙන්වා දුන්නේ ........................................................................ ජාතකයෙනි.

(18) මව්බිමෙහි සෞන්දර්යය හා සෞභාග්‍යය ........................................................................ මගින් පැවසෙයි.

(19) මංගල, සුමන යන බුදුරදුන් බුද්ධත්වයට පත්වූයේ ........................................................................ සෙවනේදී ය.

(20) මා - පිය, දූ - දරු යුතුකම් දක්වා ඇත්තේ ........................................................................ සූත්‍රයේ ය.

(ල. $2 \times 20 = 40$)

## II කොටස

I පළමු වන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

(1) කෙටි පිළිතුරු සපයන්න.

(i) සතර පෙර නිමිතිවලින් දෙකක් නම් කරන්න.

(ii) වප්මඟුල් උළෙල දා බෝසත් කුමරු වැඩූ භාවනාව කුමක්ද?

(iii) නිබ්බුත පද කීවේ කවුරුන් ද?

(iv) පස්වග තාපසයන්ගෙන් දෙදෙනෙකු නම් කරන්න.

(v) මෛත්‍රී භාවනාවේ ආනිශංස දෙකක් ලියන්න.

(vi) රාහුල හිමියන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ දෙකක් සඳහන් කරන්න.

(vii) දෙමාපියන්ගෙන් දරුවන්ට ඉටුවිය යුතු යුතුකම් දෙකක් ලියන්න.

(viii) තංච කම්මං කතං සාධු - යංකත්වා නානුතප්පති........................ යන ගාථාවේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(ix) බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතූන් වහන්සේ නිධන් කර ඇත්තේ කිනම් චෛත්‍යයක ද?

(x) බුදුරදුන් දවස සිටි දක්ෂ වෛද්‍යවරයාගේ නම කුමක්ද?

(ල. 2  10 = 20)

(2) (i) සිදුහත් කුමරු සමඟ එකට හැදුනු වැඩුනු කුමාරවරු දෙදෙනෙකු නම් කරන්න. (ල. 2)

(ii) නිබ්බුත පද ඇතුළත් ගාථාව ලියන්න. (ල. 3)

(iii) විහාරස්ථානයේදී ඔබ විසින් අනුගමනය කළයුතු වතාවත් පහක් පෙළගස්වන්න. (ල. 5)

(3) (i) ''සම්මා වාචා'' යන්නෙහි සරල අදහස සඳහන් කරන්න. (ල. 2)

(ii) වචනයෙන් සිදුවන වැරදි තුනක් ලියන්න. (ල. 3)

(iii) සිල්වත්ව කටයුතු කිරීමෙන් ශිෂ්‍යයකුට ලැබෙන ආනිශංස පහක් ලියන්න. (ල. 5)

(4) (i) සබ්බේ තසන්ති දණ්ඩස්ස......... යන ගාථාව සම්පූර්ණ කරන්න. (ල. 2)

(ii) එහි සරල තේරුම ලියන්න. (ල. 3)

(iii) තමාගේ ජීවිතයට අවංකව ආදරය කරන්නෙකු විසින් කළ හැකි යහපත් ක්‍රියා පහක් ලියන්න. (ල. 5)

(5) (i) මිහිඳු මහරහතන් වහන්සේ සමඟ වැඩම කළ රහතන් වහන්සේලා දෙදෙනෙකු නම් කරන්න. (ල. 2)

(ii) (a) ශ්‍රී ලාංකික පළමු භික්ෂූන් වහන්සේ

(b) ලංකාවේ ඉදි වූ මුල්ම පන්සල

(c) ලංකාවේ ඉදි වූ මුල්ම චෛත්‍යය නම් කරන්න. (ල. 3)

(iii) මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩම වීමෙන් පසු අපට උරුම වූ දායාද පහක් ලියන්න. (ල. 5)

(6) (i) පංචසීලයේ දෙවන හා තුන්වන සිල්පද වල තේරුම් කෙටියෙන් සඳහන් කරන්න. (ල. 2)

(ii) ත්‍රිකෝටි පාරිශුද්ධ සීලයෙහි අංශ තුන නම් කරන්න. (ල. 3)

(iii) ගසකින් වැටී කැගසන ලේන් පැටියකුට ඔබ පිහිටවන ආකාරය පිළිබඳ කෙටි විස්තරයක් සපයන්න. (ල. 5)

(7) (i) ශ්‍රද්ධාවේ ප්‍රධාන කොටස් දෙක කුමක්ද? (ල. 2)

(ii) ශ්‍රද්ධාවන්තයකු තුළ තිබිය යුතු ලක්ෂණ තුනක් ලියන්න. (ල. 3)

(iii) පහත සඳහන් වචනවලට අදාල ශාසනික වචන ලියන්න.

1 නිදා ගන්නවා

2. බුලත්

3. අතුගානවා

4. අත් සේදීම

5. යනවා

(ල. 5)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 6 - 2019

## බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය

## I කොටස

(1) 2
(2) 3
(3) 1
(4) 4
(5) 3
(6) 3
(7) 3
(8) 3
(9) 5
(10) 5
(11) දැහැමිව ජීවත් වීම
(12) යහපත් දිවි පැවැත්මයි
(13) අනුලා දේවිය
(14) සංඝමිත්තා රහත් මෙහෙණිය
(15) වෙනස්වීමයි
(16) චුල්ලරාහුලෝවාද
(17) අත්තස්ස ද්වාර
(18) ජාතික ගීය
(19) නා ගස
(20) සිඟාලෝවාද

(ල. 2 20 = 40)

## II කොටස

(1) (i) මහල්ලෙක් / ලෙඩෙක් / මළමිණියක් / පැවිදි රුවක්

(ii) ආනාපාන සති භාවනාව

(iii) කිසාගෝතමී දේවිය

(iv) කොණ්ඩඤ්ඤ / වප්ප / භද්දිය / මහානාම / අස්සජී

(v) ආනිසංශ එකොළහකින් ඕනෑම දෙකකට ලකුණු දෙන්න.

(vi) කීකරුකම / ඇත්ත කතා කිරීම / අවවාද පිළිපැදීම / අනතිමාන වීම / ඉවසීම ආදී චරිත ලක්ෂණ දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.

(vii) පවින් වැලකීම / යහපතෙහි යෙදවීම / ශිල්ප ලබාදීම / සුදුසු වයසේදී විවාහ කර දීම / සුදුසු කල දායාද දීම යන යුතුකම්වලින් දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.

(viii) තංච කම්මං කතං සාධු - යංකත්වා නානුතප්පති
යස්ස පතීතෝ සුමනො - විපාකං පටිසේවති.

(ix) ථූපාරාම චෛත්‍යය

(x) ජීවක වෛද්‍යතුමා (ල. 2 × 10 = 20)

(2) (i) නන්ද කුමරු / කාළුදායි / ඡන්න / දේවදත්ත කුමරු (ල. 2)

(ii) නිබ්බුතා නූන සාමාතා - නිබ්බුතා නූන සෝ පිතා
නිබ්බුතා නූන සා නාරී - යස්සායං ඊදිසෝපතී (ල. 3)

(iii) ලියා ඇති පිළිතුරු බලා ලකුණු දෙන්න. (ල. 5)

(3) (i) නිවැරදි වචනයයි / යහපත් වචනයයි (ල. 2)

(ii) බොරු කීම /කේළාම් කීම / පරුෂ වචන කීම / හිස් වචන කීම (ල. 3)

(iii)
* මහත් වූ භෝග සම්පත් ලැබීම
* කීර්තිය පැතිරීම
* පිරිස් මැද නොබියව කටයුතු කිරීමට හැකිවීම
* මරණයට බිය නොමැතිවීම
* මරණින් පසු සුගතියෙහි ඉපදීම (ල. 5)

**Answer**

(4) (i) සබ්බේ තසන්ති දණ්ඩස්ස
සබ්බේ භායන්ති මච්චුනො
අත්තානං උපමං කත්වා
න හනෙය්‍ය න ඝාතයෙ (ල. 2)

(ii) සියල්ලෝ දඬුවමින් තැති ගනිති. සියල්ලෝම මරණයට බිය වෙති. එහෙයින් තමා උපමාකොට අනුන් නොමරන්න. නොමරවන්න. (ල. 3)

(iii) ලියා ඇති පිළිතුරට අනුව ලකුණු දෙන්න. (ල. 5)

(5) (i) ඉට්ඨිය මහරහතන් වහන්සේ
උත්තිය මහරහතන් වහන්සේ
සම්බල මහරහතන් වහන්සේ
භද්දසාල මහරහතන් වහන්සේ (ල. 2)

(ii) *a* - අරිට්ඨ කුමරු
b - කාල පාසාද පිරිවෙන
c - ථූපාරාම චෛත්‍යය (ල. 3)

(iii) භික්ෂු පරපුරක් බිහි වීම / ස්තූප ඉදිවීම / වෙහෙර විහාර ඉදිවීම / බෞද්ධ පුද පූජා ක්‍රම ඇතිවීම / දේශීය සාහිත්‍යය පෝෂණය වීම / අධ්‍යාපනය (ල. 5)

(6) (i) සොරකම් කිරීමෙන් වැලකීමේ සිල්පදය සමාදන් වෙමි.
කාමයෙහි වරදවා හැසිරීමෙන් වැලකීමේ සිල්පදය සමාදන් වෙමි. (ල. 2)

(ii) තමා වරදින් වැලකීම
අන් අය ලවා වැරදි නොකරවීම
අන් අය කරන වැරදි අනුමත නොකිරීම (ල. 3)

(iii) ලියා ඇති පිළිතුර අනුව ලකුණු දෙන්න (ල. 5)

(7) (i) අමූලිකා ශ්‍රද්ධාව
ආකාරවතී ශ්‍රද්ධාව (ල. 2)

(ii) සිල්වතුන් දැකීමට කැමති වීම
දහම් ඇසීමට කැමති වීම
මසුරු මළ දුරු කොට පරිත්‍යාග කිරීමට කැමති වීම (ල. 3)

(iii)

| | | |
|---|---|---|
| නිදා ගන්නවා | - | සැතපෙනවා |
| බුලත් | - | දැහැත් |
| අතුගානවා | - | අමදිනවා |
| අත් සේදීම | - | අත් දෝවනය කිරීම |
| යනවා | - | වඩිනවා |

(ල. 5)